prover# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/2/9/1/ DO - XIV | ඔබේ අංකය / உனது இல. / Your Ref. | දිනය / திகதி / Date: 2022.02. 14 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,

ලේකම්(ප්‍රධාන/ කෘෂිකර්ම/ ධීවර/ ක්‍රීඩා) අමාත්‍යාංශය,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන,සැලසුම්,ඉංජිනේරු සේවා),

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,

දකුණු පළාත.

## අන්තර් පළාත් ස්ථාන මාරු සම්බන්ධ පොදු ක්‍රම වේදය

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/පරිනි) හා 2021.12.24 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2021 ට අනුව, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට අනුව අන්තර් පළාත් ස්ථාන මාරු සිදු කිරීමේදී කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන පොදු ක්‍රම වේදය මේ සමඟ ඔබ වෙත එවනු ලබන අතර, මින් ඉදිරියට ඒ අනුව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

- අන්තර් පළාත් ස්ථාන මාරු සම්බන්ධයෙන් පොදු ක්‍රමවේදය - ඇමුණුම 01
- අන්තර් පළාත් ස්ථාන මාරුවීම් වලදී එම පළාත් වල සේවය කිරීම වෙනුවෙන් ණය ශේෂ නිරවුල් කිරීම සඳහා පොදු ක්‍රමවේදය - ඇමුණුම02 (ආකෘති පත්‍ර A හා ආකෘති පත්‍ර B ඇතුලත්ව)

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

## අන්තර් පළාත් ස්ථාන මාරු සම්බන්ධයෙන් පොදු ක්‍රමවේදය

### වෙනත් පළාතක රාජ්‍ය සේවයේ සිට තවත් පළාතක රාජ්‍ය සේවය වෙත අන්තර් පළාත් ස්ථානමාරු ඉල්ලුම් කිරීමේදී එම නිලධාරීන් සම්බන්ධයෙන් සලකා බලනු ලබන පොදු නිර්ණායක හා පළාත් රාජ්‍ය සේවයෙන් වෙනත් පළාත් රාජ්‍ය සේවාවකට මුදාහැරීමේදී සලකා බලන පොදු නිර්ණායක

1. පළාත තුළ පදිංචිය
   - ස්ථාන මාරුව ඉල්ලුම් කරනු ලබන පළාත තුළ ස්ථිර පදිංචිය සහිත බව තහවුරු කිරීම සඳහා සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (DS 04) අයදුම්කරුවන්ගෙන් ලබාගැනීම.

2. අන්තර් පළාත් ස්ථාන මාරුව ලබාගැනීමෙන් පසු ස්ථාන මාරුව ලබාගන්නා පළාත තුළ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කල යුතුය යන කොන්දේසියට යටත් විය යුතුය.

3. ස්ථානමාරු අපේක්ෂිත තනතුර අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත්ව තිබීම හා එහි පුරප්පාඩු පැවතීම.

4. සේවය ස්ථිර කර තිබීම.
   - සේවය ස්ථිර කර නොමැති ස්ථානමාරු අපේක්ෂිත නිලධාරීන් විසින් දැනට පළාත් සභාවේ අදාළ තනතුරට බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සනාථ කරන ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

5. අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛණයේ අවසානයේ තැබීමේ කොන්දේසියට යටත්ව පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමට නිලධාරියා විසින් කැමැත්ත පළකර තිබීම. (මධ්‍යම රජය මඟින් බඳවාගෙන පළාත් සභාවට අනුයුක්ත කරනු ලබන තනතුරු වල නිලධාරීන් ජ්‍යෙෂ්ඨත්වයෙන් අගට තැබීම සිදුකළ යුතු නොවන අතර, එම නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සලකා බලා අදාළ ස්ථානයේ තැබිය යුතුය.)

6. පූර්ව සේවා කාලය තුළදී වසර 03ක් ඇතුළත වැටුප් රහිත නිවාඩු ලබා නොතිබිය යුතුයි. මෙම කරුණ සනාථ කරගැනීම සඳහා ස්ථානමාරු අයදුම් කරන දිනට පූර්වාසන්න වසර 03ක (පවත්නා වර්ෂයද ඇතුළත්ව) නිවාඩු වාර්තාවක් ආයතන ප්‍රධානී නිර්දේශ සහිතව ඉදිරිපත් කළයුතුය.

7. නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ ආරම්භ කිරීමට සූදානමක් හෝ නොමැති විය යුතුය. නිලධාරියාට එරෙහිව විනය කටයුතු ඇති/ නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී මඟින් සහතිකයක් ලබාගැනීම.

8. අදාළ පළාත් සභාවේ සේවා කාලය තුළදී ඊට අදාළ වන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධාරියාට එරෙහිව නොපවතින බවට ආයතන ප්‍රධානි නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

9. නිලධාරියාට එරෙහිව බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධ විගණන විමසුම් ඇති/ නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී සහතිකයක් ලබාගැනීම.

10. අදාළ නිලධාරියා පළාත් සභාවේ වියදමෙන් විශේෂ පුහුණුවක් ලබා තිබේනම්, පුහුණුවට අදාළ ගිවිසුම්ගත අනිවාර්යය සේවා කාලය ඉකුත්වී තිබීම හෝ කිසියම් බැඳුම්කරයකට යටත්කොට තිබී බැඳුම්කරයෙන් නිදහස් වී තිබීම. මෙම කරුණ සනාථ කර ගැනීම සඳහා ආයතන ප්‍රධානියා වෙතින් සහතිකයක් ලබාගැනීම.

11. නිලධාරියාගෙන් පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයක් තිබේ නම්, එම මුදල ස්ථාන මාරුවීමට අපේක්ෂිත ආයතනයෙන් එකවර ගෙවන බවට සහතිකයක් තිබිය යුතුය. මෙම කරුණ සඳහා ස්ථානමාරු අයදුම්කරුගෙන් පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳ වාර්තාවක් අදාළ ආයතන ප්‍රධානියා විසින් අයදුම්කරුගේ අයදුම්පත සමඟ අමුණා එවිය යුතු අතර, අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් නිර්දේශ ලබාගන්නා අවස්ථාවේ ස්ථානමාරු වීමට අපේක්ෂිත ආයතනයෙන් එම මුදල එකවර ගෙවන බවට එකගතාවය ලිඛිතව ලබාගැනීම.

යොමු අංකය: G/SP/3/3/TR/9

2021.12.14

තැපෑල ලදී

2021.12.14

## අන්තර් පළාත් ස්ථාන මාරුවීම් වලදී එම පළාත් වල සේවය කිරීම වෙනුවෙන් ණය ශේෂ නිරවුල් කිරීම සඳහා පොදු ක්‍රමවේදය

| | | |
|---|---|---|
| පියවර 01 | - | සියළුම පළාත්සභා කාර්යාල වෙතින් වාර්ෂිකව සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් "බී" ගිණුමට අනුව අන්තර් පළාත් ණයගැති/ ණයහිමි ශේෂ ලැයිස්තු ලබා ගැනීම. (ආකෘති පත්‍ර අංක: A හා ආකෘති පත්‍ර අංක: B මේ සමඟ අමුණා ඇත.) |
| පියවර 02 | - | නිරවුල් කළයුතු ණයගැති/ ණයහිමි ශේෂ ලැයිස්තු අනෙකුත් පළාත් සභා වෙත දන්වා යැවීම හා එම ශේෂයන්ගේ නිරවද්‍යතාවය පිළිබඳව තහවුරුවක් ලබා ගැනීම. |
| පියවර 03 | - | එක් එක් පළාත් සභා අනුව තහවුරු කිරීම් මගින් හඳුනා ගන්නා ලද ණයගැති හා ණයහිමි ශේෂ අනුව ණයගැති හා ණයහිමි ශේෂයන් ගලපා ශුද්ධ අගය සඳහා චෙක්පත් මගින් නිරවුල් කර ගැනීම. |
| පියවර 04 | - | අදාළ පළාත් සභාව තුල ඉහත පියවර 03 අනුව ගලපන ලද නිරවුල් වන ණය ශේෂයන් අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතන වෙත දන්වා යවා ඒ පිළිබඳ ගිණුම් සටහන් කරගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම සහ නිරවුල් කිරීම. |
| පියවර 05 | - | නිරවද්‍යතාවය තහවුරු නොවන ණය ශේෂයන් පිළිබඳව තොරතුරු සොයා බලා එම ණය ශේෂයන් ද නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

ගොනු අංකය: G/SP/3/3/TR/9

2021.12.14 දින ග[illegible] විසින් අනුමත කරන ලදී

[illegible]

[illegible] ලේකම් කාර්යාලය

[illegible] පළාත

## .................................. පළාතේ සිට අනෙක් පළාත් සභා වලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ

## .................. දිනට අයවිය යුතු මුළු ණය ශේෂ

(...................... දින තෙක් අය වී නොමැති, එම දින වන විට අයවිය යුතු ණය ශේෂ පමණක් වාර්තා කරන්න)

කාර්යාලයේ නම :

පළාත් සභාවේ නම: ................................ පළාත් සභාව

(*පළාත් සභා අනුව වෙන වෙනම ආකෘති පත්‍ර ඉදිරිපත් කල යුතුය.)

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | ස්ථාන මාරු වීමට පෙර රාජකාරි කළ කාර්යාලය | ස්ථාන මාරු වී ගිය වර්ෂය, මාසය, දිනය | ස්ථාන මාරු වී ගිය කාර්යාලය | .................. දිනට මුළු ණය ශේෂය රු | ණය වර්ගය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ආපදා | දේපල ණය | වාහන | උත්සව | විශේෂ | වෙනත් |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | |

පිළියෙල කලේ :
ගොනු අංකය G/SP/3/3/TR/9
පරීක්ෂා කලේ :
2021.12.14

ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි

..............................
ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරී
දිනය :

..............................
අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියා
දිනය:

**වෙනත් පළාත් සභාවල සිට ...................... පළාත් සභාවට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ**

**.................. දිනට අයවිය යුතු මුළු ණය ශේෂ**

(.................. දින තෙක් අය වී නොමැති, එම දින වන විට අයවිය යුතු ණය ශේෂ පමණක් වාර්තා කරන්න)

කාර්යාලයේ නම :

පළාත් සභාවේ නම: ------------------------------ පළාත් සභාව

(*පළාත් සභා අනුව වෙන වෙනම ආකෘති පත්‍ර ඉදිරිපත් කල යුතුය.)

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | ස්ථාන මාරු වීමට පෙර රාජකාරී කළ කාර්යාලය | ස්ථාන මාරු වී ගිය වර්ෂය, මාසය, දිනය | ස්ථාන මාරු වී ගිය කාර්යාලය | .................. දිනට මුළු ණය ශේෂය රු | ණය වර්ගය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ආපදා | දේපල ණය | වාහන | උත්සව | විශේෂ | වෙනත් |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | |

පිළියෙල කළේ: ........G/SP/3/3/2019........ ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි

පරීක්ෂා කලේ: 2021.07.14 ... විසින් අනුමත කරන ලදී

------------------------------
ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරී
දිනය :

------------------------------
අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියා
දිනය:

ආ.යු./වෙළ්./පරිපි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත